# වම

පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ මධ්‍යම පුවත්පත

ISSN 3121-3529

12 කාණ්ඩය 05 කලාපය

2026 ජූලි





05 හෝද හෝද මඩේ දානවා ද? ගොවි බලයක් ගොඩ නගනවා ද?




06 ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත



08 සාපලත් කළු ජූලියේ සැඟවුණ තතු සොයායාම



09 ඖසප් බද්ද කාන්තාවන්ට ගහන ආර්ථික දඬය



11 එල් නිනෝ ගොඩිසිලා කෙනෙක් වෙයිද?



පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. ආධාරය රු 70.00


# අතුරුදන්කිරීම් ගැන සාක්ෂි දෙන්න ගෝඨා අධිකරණයට කැඳවයි

**යුද්ධයේ හා යුද සමයෙන් පසු උතුර ඇතුළු රට පුරා සිදුව ඇති අතුරුදන්කිරීම් සම්බන්ධ සාක්ෂි දීමට ගෝඨාභය රාජපක්ෂට සිදුව තිබේ. 2011 දෙසැම්බර් මස 9 වැනිදා යාපනයේදී පැහැරගනු ලැබ ආරක්ෂක අංශ භාරයේ පසු වූ බව හෙළි වූ ලලිත් කුමාර් වීරරාජු සහ කුගන් මුරුගානන්දන් සම්බන්ධයෙන් යාපනය මහෙස්ත්‍රාත් අධිකරණයේ විභාග වන හබයාස් කෝපුස් නඩුවේදී සාක්ෂි දීම මගහැර සිටි හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මේ අනුව ජූලි මස 3වැනිදා එම අධිකරණය වෙත සාක්ෂි දීම සිදුවනු ඇත.**

යුද සමයේ සහ ඉන්පසු අතුරුදන්කිරීම් සම්බන්ධයෙන් 2011 දෙසැම්බර් 10 වැනිදා මානව හිමිකම් දිනයේ මාධ්‍ය හමුවක් පැවැත්වීමට කටයුතු කරමින් සිටි ලලිත් හා කුගන් දෙදෙනා ඉන් පෙරදින යාපනයේ අවරන්ගල් ප්‍රදේශයේදී යතුරුපැදියකින් යමින සිටියදී සුදු වෑන් රථයකින් පැමිණ පැහැර ගෙන ගොස් ඇති බවට සාක්ෂි ඉදිරිපත් විය. එහිදී එම දෙදෙනාගේ ඥාතීන් විසින් අභියාචනාධිකරණයට ගොනු කළ හබයාස්කොපුස් පෙත්සම් විභාගවලදී සාක්ෂිකරුවන්ගේ ලේඛනයට එවකට ආරක්ෂක අමාත්‍යංශ ලේකම් ලෙස කටයුතු

02 වැනි පිටුවට..

## ඒකපුද්ගල දරිද්‍රතා රේඛාව 17,000 ඉක්මවයි.

ජීවන වියදම ඉහළ යාමත් සමඟ පුද්ගල දිළිඳුකම් රේඛාව මසකට රු. 17,117 දක්වා ඉහළ ගොස් ඇතැයි වාර්තා වේ.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද නවතම දත්තවලට අනුව, මූලික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා වැය වන පිරිවැය ඉහළ යාම හේතුවෙන් 2026 අප්‍රේල් මාසයේදී ජාතික නිල දිළිඳුකම් රේඛාව (OPL) එක් පුද්ගලයෙකු සඳහා මසකට රුපියල් 17,117 දක්වා ඉහළ ගොස් ඇත. එය මාර්තු මාසයේ පැවති රුපියල් 16,690ක අගයට වඩා වැඩි වීමකි.

රට පුරා ජීවන වියදමේ සිදුවන වෙනස්වීම් නිරීක්ෂණය කරනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (NCPI) සිදුවූ ඉහළ යාම මෙම වැඩිවීමට හේතු වූ බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පෙන්වා දෙයි.

දිස්ත්‍රික් මට්ටමේ දත්ත සලකා බැලීමේදී දිළිඳුකම් සීමාවන්හි කැපී පෙනෙන වෙනස්කම් දක්නට ලැබුණි. එහිදී ඉහළම දිළිඳුකම් රේඛාව කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ අතර එය

02 වැනි පිටුවට..

## ජනතා බලයක් වෙනුවෙන් විරෝධය කොළඹට

ජීවන බර අඩු කරන ලෙස ආණ්ඩුවට බල කරමින් ජන අරගල ව්‍යාපාරය මරදානේ සිට පැමිණි විරෝධතා පා ගමනට කොළඹ කොටුව දුම්රියපොළ ආසන්නයේදී පොලිසිය බාධා කළේය. නමුත් පොලිසියේ බාධා නොතකමින් විරෝධතාකරුවෝ කොළඹ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය අසලට පා ගමනින් පැමිණ එහිදී රැස්වීමක් පැවැත් වූහ.






